කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර ) - 2008

**BCOM E 1054 –** ව්‍යාපාර නීතිය.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. (අ) " සියළුම ගිවිසුම් එකඟත්වයන් වන අතර සියළුම එකඟත්වයන් ගිවිසුම් නොවේ " සුදුසු නිදසුන් යොදා ගනිමින් මෙම ප්‍රකාශයෙහි ඇති වලංගුතාවය විමසන්න.

(ලකුණු 10)

(ආ) අමල් ඉඩමක් රුපියල් ලක්ෂ 10 කට සේනකට විකිණීම පිණිස අර්පනයක් ඉදිරිපත් කරන ලදී. සේනක අර්පණය ප්‍රතිග්‍රහණය කළ අතර ඒ සමඟ රු. 200,000/- වටිනාකමින් යුත් චෙක්පතක් එවූ අතර ඉතිරි මුදල රු. 100,000/- බැගින් වූ මාසික වාරික මගින් ගෙවීමටද පොරොන්දු විය. අමල් සහ සේනක අතර ගිවිසුමක් හට ගෙන ඇතිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. (අ) ගිවිසුමක වලංගුභාවය සම්බන්ධයෙන් පහත වැරදීම් බලපාන්නේ කෙසේද ? ඔබගේ පිළිතුර සඳහා උදාහරණ දෙන්න.

i. විෂය වස්තුවේ පැවැත්ම පිළිබඳ පොදු වැරදීම.

ii. විෂය වස්තුවේ අනන්‍යතාවය පිළිබඳ අන්‍යොන්‍ය වැරදීම.

iii. විෂය වස්තුවේ ගුණාත්මකවය පිළිබඳ ඒකපාර්ශ්වික වැරදීම.

(ලකුණු 12)

(ආ) ගිවිසුම් කඩ කිරීම යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ? සුදුසු නිදසුන් යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

03. (අ) වලංගු අපරානුමැතිය මත නියෝජ්‍යත්වය ස්ථාපනය කිරීම පිණිස සපුරාලිය යුතු කොන්දේසි මොනවාද ?

(ලකුණු 10)

(ආ) විනිශ්චිත නඩු තීන්දු වලට අවධානය යොමු කරමින් නියෝජිතයෙකු සතු යුතුකම් සහ අයිතිවාසිකම් මොනවාදැයි සඳහන් කරන්න.

(ලකුණු 10)

04. (අ) සමන් DVD යන්ත්‍රයක් ඉලෙක්ට්‍රොනික්ස් වර්ල්ඩ් පුද්ගලික සමාගමෙන් මිලදී ගන්නා ලදී. එම සාප්පුවේදීම සමන් එම යන්ත්‍රය පරීක්ෂා කරන ලදී. නමුත් අදාල යන්ත්‍රයෙහි වැසිය බරපතල

ලෙස පලුදු වී ඇති බැව් පසුව සමන් දැනගනියි. සමන්ට මෙම ගිවිසුම අවලංගු කළ හැකිද ? ඔබගේ පිළිතුරට හේතු විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

(ආ)i. මිල නොලත් විකුණුම්කරු යනු කවරෙක්ද ?

ii. මිල නොලත් විකුණුම්කරුවෙකු සතු නෛතිකමය ප්‍රතිකර්ම කවරේද ?

(ලකුණු 10)

05. (අ) ඇන් සිය දියණිය රෝෂිණී සහ බෑණනුවන් වන ගිහාන් සාර්ථක නිමි ඇඳුම් ව්‍යාපාරයක හවුල්කරුවන්ය. ඔවුහු සිය හවුල් ව්‍යාපාරය, සමාගමක් බවට පත් කිරීම පිළිබඳව සලකා බලමින් සිටිති. හවුල් ව්‍යාපාරයක්, සීමිත පුද්ගලික සමාගමක් බවට පත් කිරීමෙන් අත්කර ගත හැකි වාසි සහ අවාසි මොනවාදැයි ඔබගෙන් දැන ගැනීමට ඔවුනට අවශ්‍යව ඇත. ඔවුනට උපදෙස් දෙන්න.

(ලකුණු 08)

(ආ)හවුල් ව්‍යාපාරයක සිටිය හැකි විවිධ අන්දමේ හවුල්කරුවන් කවුරුන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ)සැලමන් ඒ සැලමන් සහ සමාගම (1897) AC 22 විනිශ්චිත නඩු තීන්දුවෙන් විස්තර කරනු ලබන නෛතික මූලධර්මය කුමක්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

06. (අ) ගණුදෙනු කළ හැකි ලියවිල්ලක තිබිය යුතු මූලික ලක්ෂණ මොනවාද ?

(ලකුණු 06)

(ආ)අජිත් ධාරක බිල්පත්‍රයක අදායකයා වේ. අදාල බිල්පත්‍රය අජිත් අතින් සිය කාර්යාලයේදී අස්ථානගත විය. බන්දුට එම බිල්පත්‍රය හමුවේ. බන්දු එම බිල්පත්‍රය කසුන්ට දෙන අතර ඒ සඳහා අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවා සද්භාවයෙන් කසුන් එය ලබා ගනියි. බිල්පත්‍රයෙහි වර්තමාන දරන්නා වශයෙන් කසුන් සතු අයිතිවාසිකම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ඇ)චෙක්පත් රේඛනය කිරීමේ විවිධාකාර ක්‍රම මොනවාදැයි දක්වන්න. සාමාන්‍ය රේඛනය සහ විශේෂ රේඛනය අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 06)

07. පහත සඳහන් දෑ අතුරින් හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ගිවිසුම් වල අඩංගු වගකීම් අත් හැරීමේ වගන්ති.

ii. රක්ෂණීය හිමිකම.

iii. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ස්වභාවය.

iv. නියෝජ්‍යත්වය අවසන් වීම.

v. විනිමය බිල්පත්‍රයක ලක්ෂණ.

(ලකුණු 5x4)

ලෙස පලුදු වී ඇති බැව් පසුව සමන් දැනගනියි. සමන්ට මෙම ගිවිසුම අවලංගු කළ හැකිද ? ඔබගේ පිළිතුරට හේතු විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

(ආ) i. මිල නොලත් විකුණුම්කරු යනු කවරෙක්ද ?

ii. මිල නොලත් විකුණුම්කරුවෙකු සතු නෛතිකමය ප්‍රතිකර්ම කවරේද ?

(ලකුණු 10)

05. (අ) ඇන් සිය දියණිය රෝෂිණි සහ බෑණනුවන් වන ගිහාන් සාර්ථක නිමි ඇඳුම් ව්‍යාපාරයක හවුල්කරුවන්ය. ඔවුහු සිය හවුල් ව්‍යාපාරය, සමාගමක් බවට පත් කිරීම පිළිබඳව සලකා බලමින් සිටිති. හවුල් ව්‍යාපාරයක්, සීමිත පුද්ගලික සමාගමක් බවට පත් කිරීමෙන් අත්කර ගත හැකි වාසි සහ අවාසි මොනවාදැයි ඔබගෙන් දැන ගැනීමට ඔවුනට අවශ්‍යව ඇත. ඔවුනට උපදෙස් දෙන්න.

(ලකුණු 08)

(ආ) හවුල් ව්‍යාපාරයක සිටිය හැකි විවිධ අන්දමේ හවුල්කරුවන් කවුරුන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) සැලමන් ඒ සැලමන් සහ සමාගම (1897) AC 22 විනිශ්චිත නඩු තීන්දුවෙන් විස්තර කරනු ලබන නෛතික මූලධර්මය කුමක්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

06. (අ) ගණුදෙනු කළ හැකි ලියවිල්ලක තිබිය යුතු මූලික ලක්ෂණ මොනවාද ?

(ලකුණු 06)

(ආ) අජිත් ධාරක බිල්පත්‍රයක අදායකයා වේ. අදාල බිල්පත්‍රය අජිත් අතින් සිය කාර්යාලයේදී අස්ථානගත විය. බන්දුට එම බිල්පත්‍රය හමුවේ. බන්දු එම බිල්පත්‍රය කසුන්ට දෙන අතර ඒ සඳහා අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවා සද්භාවයෙන් කසුන් එය ලබා ගනියි. බිල්පත්‍රයෙහි වර්තමාන දරන්නා වශයෙන් කසුන් සතු අයිතිවාසිකම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ඇ) චෙක්පත් රේඛනය කිරීමේ විවිධාකාර ක්‍රම මොනවාදැයි දක්වන්න. සාමාන්‍ය රේඛනය සහ විශේෂ රේඛනය අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 06)

07. පහත සඳහන් දෑ අතුරින් හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ගිවිසුම් වල අඩංගු වගකීම් අත් හැරීමේ වගන්ති.

ii. රක්ෂණීය හිමිකම.

iii. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ස්වභාවය.

iv. නියෝජ්‍යත්වය අවසන් වීම.

v. විනිමය බිල්පත්‍රයක ලක්ෂණ.

(ලකුණු 5x4)